**FACULTY OF INDIGENOUS MEDICINE – UNIVERSITY OF COLOMBO**

*Founded in 2023*

*Department of Basic Principles, Ayurveda Anatomy and Physiology*

*(Department of Moolika Siddhanta and Shareera Vignana)*


ගරු ස්වාමීන්වහන්ස/ පූජකතුමනි,
මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනවියනි,

**වෛද්‍ය අධ්‍යාපනය හා වෛද්‍ය පර්යේෂණ සඳහා මෘත දේහ පරිත්‍යාග කිරීමේදී අනුගමනය කලයුතු ක්‍රියා පිළිවෙත්**

මරණින් පසුව ඔබගේ දේහය දේශීය වෛද්‍ය පීඨය වෙත ප්‍රදානය කිරීම සඳහා ඔබ තුළ ඇති කැමැත්ත ඉතා අගය කොට සලකමු. මරණින් පසු මෘත දේහයේ භාරකාරත්වය ඥාතීන්/ භාරකරුවන් සතු වේ. එම නිසා ඔබ ඒ සඳහා ඥාතීන් පහත සඳහන් උපදෙස් පරිදි දැනුවත් කර තිබීම වැදගත් වේ.

1. මෘත දේහයක් පරිත්‍යාග කල හැක්කේ **ස්වාභාවික මරණයක් නම්** පමණක් වන අතර පහත සඳහන් ආකාරයේ මෘත දේහ පරිත්‍යාග කල නොහැක.
    - මිය යන විට දියවැඩියාව, පිළිකා, මෙනින්ජී ප්‍රදාහය (Meningitis), ක්ෂය රෝගය, සෙංගමාලය, එච්.අයි.වී./ ඒඩ්ස්, දද, කුෂ්ඨ වැනි රෝග වැළඳී තිබීම.
    - ඇස් හැර අනෙකුත් අවයව ඉවත් කළ හෝ පරිත්‍යාග කළ මෘත දේහ.
    - මරණින් පසු අවශ්‍ය පරිදි එම්බාම් (ස්වාරක්ෂණය) කිරීමකින් තොරව පැය 18 ක් කල් ඉකුත් වූ මෘත දේහ.
    - ප්‍රධාන ශල්‍යකර්මවලට භාජනය කල මෘත දේහ.
    - ඇඳ වණ හෝ මෑතකදී සිදු කළ ශල්‍යකර්ම නිසා ඇති වූ විවෘත තුවාල ඇති දේහ.

2\.

2.1. මෞලික සිද්ධාන්ත හා ශරීර විඥාන දෙපාර්තමේන්තුවට භාරදීමට ප්‍රථම මෘත දේහය අනිවාර්යයෙන්ම එම්බාම් කල යුතු වේ. එම්බාම් කළ යුත්තේ පාදයේ කලවා පෙදෙසේ ඉහල කොටසේ ඉදිරියෙන් පිහිටි ඌර්ව ධමනිය තුළින් ස්වාරක්ෂක තරලය (40% ෆෝමලින්) ලීටර් 5ක් ශරීරයට ඇතුළු කිරීමෙනි.

2.2. ඉහත කී ආකාරයට හැර අන් කිසිදු ආකාරයකින් එම්බාම් කර භාරදෙන මෘත දේහ භාරගනු නොලැබේ.

2.3. අක්ෂිදාන සංගමයට මියගිය තැනැත්තාගේ ඇස් දන් දීම ගැන විරුද්ධත්වයක් නොමැත. (ශරීරයේ වෙනත් කොටසක් කැපීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.)

3\.

3.1. මරණය සිදු වූ වහාම ඒ බව ඥාතීන්/ භාරකරුවන් විසින් පහත සඳහන් නිලධාරීන්ගෙන් එක් අයකු දැනුවත් කර භාරදීම සඳහා අවශ්‍ය නිසි උපදෙස් ලබා ගත යුතුය.

- පී.එස්. නන්දන මයා ( තාක්ෂණ නිලධාරී) — 077 865 0354
- ඒ.එම්.එම්.එස්. ලක්ෂාණි මෙය (කළමනාකරණ සහකාර) — 078 950 0022
- දෙපාර්තමේන්තු ප්‍රධානී මහාචාර්ය එස්.පී. මොල්ලිගොඩ මහත්මිය — 071 444 0327
- දේශීය වෛද්‍ය පීඨය — 011 269 4308 / 011 269 2385

**3.2. දේහය භාරදීමට පෙර ඉහත දක්වා ඇති දුරකථන අංක මඟින් දෙපාර්තමේන්තුව වෙත සතියේ දිනවල පෙ.ව. 8.30 ත් ප.ව. 4.00 ත් අතර ඇමතුමක් ලබාගැනීම අවශ්‍ය අතර දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පරිදි දේහය භාරගැනීමට හැකිබව සනාථ කර ගැනීම අත්‍යවශ්‍ය බැව් කරුණාවෙන් සලකන්න. මෘත ශරීර භාරගනු**

**ලබන්නේ සතියේ දිනවල (රජයේ නිවාඩු හැර) පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා පමණි. ( සෙනසුරාදා හා ඉරිදා දිනයන්හි දී මෘත ශරීර භාර ගනු නොලබන බව කරුණාවෙන් සලකන්න.)**

3.3. මෘතදේහ බහාලන ටැංකිවල ඉඩකඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හි දී මෞලික සිද්ධාන්ත හා ශරීර විඥාන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණ ද අත්‍යවශ්‍ය ප්‍රමාණයට පමණක් මෘත දේහ භාර ගන්නා බව කාරුණාවෙන් සලකන්න.

3.4. මෘත දේහ දේශීය වෛද්‍ය පීඨයට භාර දීමේදී අනිවාර්යයෙන් සැපයිය යුතු ලිපි ලේඛණ,

- **මරණය ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපත හා සහතික කල ඡායා පිටපතක්, සහතිකය නොමැතිව කිසිදු හේතුවක් මත මෘත දේහ භාරගනු නොලැබේ.**
- **දායකයාගේ ජාතික හැඳුනුම්පතෙහි මුල්පිටපත (සසඳා බැලීම සඳහා) හා සහතික කල ඡායා පිටපතක්.**
- **ඥාතියාගේ/ භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි මුල් පිටපත (සසඳා බැලීම සඳහා) හා සහතික කළ ඡායා පිටපතක්**
- **මෘත ශරීර භාරදීමේ පොරොන්දු පත්‍රයේ පිටපත**
- **මරණය ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපත භාරදීම අනිවාර්ය වන අතර එය නැවත භාර දෙනු නොලැබේ.**

3.5. මෘත දේහයක් පරිත්‍යාග කිරීමට පැමිණෙන පුද්ගලයන් විසින් සැලකිලිමත් විය යුතු අනෙකුත් කරුණු.

- මෘත දේහය භාර ඥාති හිතමිත්‍රාදීන් ආයතනයේ සහ දෙපාර්තමේන්තුවේ අධ්‍යයන කටයුතු වලට බාධා නොවන පරිදි කටයුතු කළ යුතු අතර දේහය සමග ආයතන භූමියට ඇතුළුවිය හැක්කේ උපරිම 06 දෙනෙකුට පමණක් බව සැලකිය යුතු අතර මෘත දේහය භාරගන්නා අවසන් තීරණය දෙපාර්තමේන්තු ප්‍රධාන සතු බව කරුණාවෙන් සලකන්න.
- දේශීය වෛද්‍ය පීඨය විසින් ප්‍රවාහන පහසුකම් හෝ වියදම් සපයනු නොලැබේ.
- දේශීය වෛද්‍ය පීඨය තුළ ආගමික හෝ වෙනයම් උත්සවයක් පැවැත්වීමට අවසර නොලැබේ.
- ඥාතීන්ගේ/ භාරකරුගේ ඉල්ලීම පරිදි දේශීය වෛද්‍ය පීඨය තුළදී දායකයාගේ දේහයෙන් සාදනු ලබන ඇට සැකිල්ල හෝ ඇට සැකිල්ලේ කොටස් පිළියෙළ කර දෙනු නොලැබේ.

**4. මෘත දේහ භාරදීම සඳහා ජීවත්ව සිටියදී කැමැත්ත ප්‍රකාශ කිරීමේ සහතිකය දෙපාර්තමේන්තුව වෙතින් නිකුත් කළද, මෘත දේහය භාරගැනීමේ අවසාන තීරණය එම අවස්ථාව වන විට පවතින තත්ව යටතේ මෞලික සිද්ධාන්ත හා ශරීර විඥාන දෙපාර්තමේන්තු ප්‍රධානී ඇතුළු කාර්යමණ්ඩලය විසින් තීරණය කරනු ලබන අතර ලියාපදිංචි වූ පමණින් එම දේහයන් භාර ගැනීමට දෙපාර්තමේන්තුව බැඳී නොසිටින බව කරුණාවෙන් සලකන්න.**

දෙපාර්තමේන්තු ප්‍රධානී / මහාචාර්ය එස්.පී. මොල්ලිගොඩ
මෞලික සිද්ධාන්ත හා ශරීර විඥාන දෙපාර්තමේන්තුව
දේශීය වෛද්‍ය පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය
රාජගිරිය

**FACULTY OF INDIGENOUS MEDICINE – UNIVERSITY OF COLOMBO**
*Founded in 2023*

*Department of Basic Principles, Ayurveda Anatomy and Physiology*
*(Department of Moolika Siddhanta and Shareera Vignana)*

---

## <u>මෘත දේහ පරිත්‍යාග කිරීම සඳහා අයදුම්පත</u>

**01. දායකයාගේ විස්තර**

1.1. සම්පූර්ණ නම :..............................................................................................................
..............................................................................................................
1.2. ලිපිනය :..............................................................................................................
..............................................................................................................
1.3. ජා.හැ. අංකය :..............................................................................................................
1.4. වයස :..............................................................................................................
1.5. දුරකථන අංක : 1.................................................. 2..................................................
1.6. ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී / පුරුෂ
1.7. ශල්‍යකර්මයකට භාජනය වී ඇත්නම් ඒ පිළිබඳ විස්තර :....................................................
..............................................................................................................................
1.8. පහත දැක්වෙන කුමන හෝ රෝගයකින් ඔබ පසුවන්නේද?

පිළිකා ☐ මෙනින්ජයි ප්‍රදාහය ☐ ක්ෂය රෝගය ☐ සෙංගමාලය ☐

එච්.අයි.වී./ඒඩ්ස් ☐ දද/කුෂ්ට ☐ දියවැඩියාව ☐

වෙනත් :..............................................................................................................................

**02. දායකයාගේ ආසන්න ඥාතියා / භාරකරුගේ විස්තර**

2.1. සම්පූර්ණ නම :..............................................................................................................
..............................................................................................................................
2.2. ලිපිනය :..............................................................................................................
..............................................................................................................................
2.3. ජා.හැ. අංකය :..............................................................................................................
2.4. දායකයාට ඇති ඥාති සම්බන්ධතාවය : ..........................................................................
2.5. දුරකථන අංක : 1.................................................. 2..................................................

මා මිය යාමෙන් පසුව මාගේ මෘත දේහය වෛද්‍ය අධ්‍යාපනය සහ වෛද්‍ය පර්යේෂණ සඳහා දේශීය වෛද්‍ය පීඨයේ මෞලික සිද්ධාන්ත හා ශරීර විඥාන දෙපාර්තමේන්තුවට පරිත්‍යාග කිරීමට කැමැත්ත මෙයින් ප්‍රකාශ කර සිටිමි.මේ සම්බන්ධයෙන් දේශීය වෛද්‍ය පීඨයේ උපදෙස් පත්‍රිකාවේ දක්වා ඇති උපදෙස් අනුව කටයුතු කරන බවද මෙයින් ප්‍රකාශ කරමි.

මෙයට විශ්වාසී

..................................... ........................................
දායකයාගේ අත්සන දිනය

---

***Office of the Dean, Faculty of Indigenous Medicine, University of Colombo, Rajagiriya, Sri Lanka***
***Office - +94112862385***
***Fax - +94112697175***
***E-mail - dean@fim.cmb.ac.lk***

**FACULTY OF INDIGENOUS MEDICINE – UNIVERSITY OF COLOMBO**

*Founded in 2023*

*Department of Basic Principles, Ayurveda Anatomy and Physiology*

*(Department of Moolika Siddhanta and Shareera Vignana)*

---


සැලකිය යුතුයි :

01. අයදුම්පතෙහි පිටපතක් ඔබගේ ඥාතියෙකු / භාරකාරයෙකු භාරයෙහි තැබිය යුතු අතර, මෘත දේහය පරිත්‍යාග කිරීමේදී අදාළ අයදුම්පතෙහි පිටපත සමඟ දේහය දේශීය වෛද්‍ය පීඨය වෙත භාර දිය යුතුය.

02. මෘත දේහ පරිත්‍යාග කිරීම සඳහා දේශීය වෛද්‍ය පීඨයේ මෞලික සිද්ධාන්ත හා ශරීර විඥාන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටිය ද දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ උපදෙස් පත්‍රිකාවේ කරුණු සම්පූර්ණවේ නම් පමණක් දේහය භාරගන්නා බව කරුණාවෙන් සලකන්න.

03. අක්ෂි දන් දෙන්නේ නම්, මෘත දේහය ශරීර විඥාන දෙපාර්තමේන්තුවට භාර දීමට පෙර අක්ෂිදාන සංගමයට මියගිය තැනැත්තගේ ඇස් දන් දීම සිදු කළ යුතුය.

**04. මෘත දේහ භාරදීම සඳහා ජීවත්ව සියදී කැමැත්ත ප්‍රකාශ කිරීමේ සහතිකය දෙපාර්තමේන්තුව වෙතින් නිකුත් කළද, අනිවාර්යෙන් දේහය භාරගැනීමේ අවසාන තීරණය එම අවස්ථාව වන විට පවතින තත්ව යටතේ** මෞලික සිද්ධාන්ත හා ශරීර විඥාන දෙපාර්තමේන්තු **ප්‍රධානී ඇතුළු කාර්ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අතර ලියාපදිංචි වූ පමණින් එම දේහයන් භාර ගැනීමට දෙපාර්තමේන්තුව බැඳී නොසිටින බව කරුණාවෙන් සලකන්න.**



දෙපාර්තමේන්තු ප්‍රධානී / මහාචාර්ය එස්.පී. මොල්ලිගොඩ
මෞලික සිද්ධාන්ත හා ශරීර විඥාන දෙපාර්තමේන්තුව
දේශීය වෛද්‍ය පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය
රාජගිරිය

---

***Office of the Dean, Faculty of Indigenous Medicine, University of Colombo, Rajagiriya, Sri Lanka***
***Office - +94112862385***
***Fax - +94112697175***
***E-mail - dean@fim.cmb.ac.lk***